

මගේ ලෝකය

# දිග ගමනක මතක සටහනක්

## ක්රේගිබර්න් සූරිය උදානය සිංහල සහ දමිළ අලුත් අවුරුදු උළෙල



අවුරුදු උළෙලක් යනු හුදු සැණකෙළි යක් නොවේ. එය වදන් සීමාවෙන් ඔබ්බට ගිය පුරුෂාර්ථ රැසක් එක්තැන් කරගත් සංස්කෘතික වේදිකාවකි. මේ වේදිකාව විගාමිකයන් වූ අපට ඉතා වැදගත් වන්නේ එය අපෙන් ගිලිහී යන බොහෝ වටිනාකම් නැවත නැවතත් සිහිපත් කරදෙන නිසා පමණක් නොවේ ඒ වටිනාකම් අපේ මතු



පරම්පරාවේ හදවත් තුළ ද තැන්පත් කරන නිසා ය.

මේ කතාව ඇරඹෙන්නේ 2011 වසරේ දී ය. ඒ යුගය පිළිබඳ අපැහැදිලි මතකය අතරේ මට එක් සිදුවීමක් මතක ය. ඒ චන්ද්‍රා දයා බමුණුසිංහ මහතා මා අමතා කළ හෙළිදරව්ව ය.



"අපි ක්රේගිබර්න් ප්‍රදේශයේ අලුත් අවුරුදු උත්සවයක් පටන් ගන්නවා. ඒකට පෝස්ටරයක් හදා දෙන්න පුලුවන්ද?" ඔහු කළ ඒ ඉල්ලීම ඉටුකර දුන්නෙමි. ආරම්භක වසර දෙකේම ඒ අවශ්‍යතාව ඉටු කරදුන්නෙමි. එපමණක් නොවේ. මේ අලුත් අවුරුදු උත්සවය පිළිබඳ පණිවුඩය සන්නස පුවත්පතින් අපේ සමාජයට ගෙන ගියෙමි. එතැන් සිට ගතවූ අවුරුදු නවයෙන් අටකදීම මම මේ අවුරුදු උලෙලට සහභාගිවූයෙමි.

ඒ අතීතය නැවත සිහිපත් කරගන්නට අවශ්‍ය ය. මම මේ ලිපිය ලියන්නට පෙර දයා බමුණුසිංහ මහතා ඇමතුවෙමි. ඔහු ලවා ඒ අතීතාවර්ජනය කරගත්තේ මේ ලිපියට අවශ්‍ය සමහර කරුණු එක් තැන් කරගන්නටය. ඒ පිලිබඳව පළමුව ඔහුට ස්තුතිවන්ත වෙමු.

උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුබසාධක සංගමය නමින් ආම්භවුණ සංගමය 2011 වසරේදී සිය පළමු සිංහල සහ දමිල අවුරුදු උත්සවය ක්රේගිබර්න්හිදී ආරම්භ කරද්දී මුහුණ දුන් අභියෝග රැසකි. ඒ අභියෝග ජය ගන්නට ඔවුනට හැකි වූයේ ඒ වටා එක් රොක් වූ සහෘදයන් නිසා ය. ඒ නම් ලැයිස්තුව බොහෝ දිග එකකි. සභාපති



ලෙස දයා බමුණුසිංහත් ලේකම් ලෙස රත්නපාල දිසානායකත් අරුණ විජේතුංග භාණ්ඩාගාරික ලෙසත් කළ මෙහෙය අපමණය. ඔවුන් වටා එක් රොක් වුණ විජිත දෙල්ගම, හංස විජේසිංහ, චන්දන ඉඹුලාන, අසංග විතාරණගේ, සරත් චන්ද්‍රසිරි, ගාමිණී පැලෑඳ, ඩී එච් ධර්මසිරි, ජගත් ගුණතිලක, රත්නසිරි ප්‍රනාන්දු, අජිත් කැකුණවෙල, සුනිල් රූපසිංහ, සරත් රණතුංග, සඳුන් මාණික්කවඩු, තිලක් රණතුංග, කුලරත්න මඩවලගේ, ඉල්ටන් ප්‍රනාන්දු, තිස්ස ෆෙඩ්රික්, සෝමරත්න ගලගෙදර, සුජිත් කෑරගල, සුදත් වීරසිංහ, විජේරත්න රාජකීර්ති, සරත් ජයතිලක (යම් නමක් අමතකවී ඇත්නම් කමත්වා) මේ අවුරුදු උත්සවය සාර්ථකත්වය කරා ගෙනයන්නට උර දුන් හ.

මේ වන විට මෙල්බන්හි පවත්වාගෙන ආ ප්‍රධාන අවුරුදු උත්සවය වූ ඩැන්ඩි නොන් කේන්ද්‍ර කරගනිමින් ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද අවුරුදු උත්සව මාලාවට සමගාමීව තවත් අවුරුදු උත්සවයක් ආරම්භකිරීම ඉතා අභියෝගාත්මක භාරධූර කාර්යයක් වූ බව කිව යුතු නොවේ. අපේ සමාජයේ සැවොම පුරුදුව සිටියේ අවුරුදු උත්සවය සඳහා ඩැන්ඩිනොන් යන්නට ය. එය ඉතා දුර බැහැර ගමනක් වූ නමුත් අපේ කම කෙරෙහි බැඳුණ සිත් ඇති පිරිස ඒ දුර ගමන සෑම වසරකම නොවරදවා ගියහ. තමන් අත ළඟට ආ ක්රේගිබර්න් අවුරුදු උළෙල ඔවුනට පහසුවක් විය.
ක්රේගිබර්න් අවුරුදු උත්සවය සූරිය උදානය නමින් නම් කරන්නට මූලික වූ දෙදෙනෙක් අපේ මතකයට එයි. අවුරුදු උත්සවයේ සම්බන්ධීරණය බාරව සිටි හංස



විජේසිංහ සහ අභාවප්‍රාප්ත ප්‍රවීණ ගත්කරු ඩී බී කුරුප්පු ඒ දෙදෙනා යි. ඔවුන් දෙදෙ නාම මේ නම එකම කාලයකදී යෝජනා කිරීම විස්මිත ය. කෙසේ වුවද ඒ නම මේ අලුත් අවුරුදු උත්සවයට මනාව ගැළපුණි.



අද ක්රේගිබර්න්හි සූරිය උදානය අලුත් අවුරුදු උළෙල නොදන්නා ශ්‍රී ලාංකිකයකු මේ ප්‍රාන්තයේ සිටින්නේ යයි මම නොසිතමි.

ආරම්භයේ සිටම සූරිය උදානය උළෙල යම් වැදගත් සමාජයීය සේවයක් කරමින් සිටි බවත් ඒ පදනම අද දක්වාම පවත්වාගෙන යන බවත් අපි දනිමු. ඒ හුදෙක් සිංහල අවුරුදු උත්සවයක් බවට මේ අවුරුදු උත්සවය පත් නොකර එය සිංහල හා දමිළ අවුරුදු උත්සවයක් බවට පත්කිරීමය. සියලුම ජාතීන් වලට අයත් ශ්‍රී ලාංකිකයන් අද ක්රේගිබර්න් සූරිය උදානයට එක් රොක් වන්නේ ඒ දැමූ පදනම නිසා ය.

සම්ප්‍රදායික ජන ක්‍රීඩා සියල්ලම පාහේ අද සූරිය උළදානයේදී අපට දැක ගත හැකි ය. ඒ සියල්ල මනා සංවිධානයකින් යුක්තව පවත්වාගෙන යන්නට සංවිධායකවරුන් දක්වන කැපවීම අගය කළ යුතුම ය. වික් ටෝරියා ප්‍රාන්තයේ හියුම් සිටි කවුන්සිලයේ සහයෝගය ආරම්භයේ සිංට මේ උළෙලට ලැබුණ බව සඳහන් කළ යුතු ය. ඒ හැරෙන්නට සූරිය උදානයට සහයෝගය දෙන තවත් සංවිධාන සහ ව්‍යාපාර රැසක් ඇති බවද අමතක නොකළ යුතුය.

කාලයට අනුරූපව උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුබසාධක සංගමය අද වන විට උතුරු වික්ටෝරියා සුබසාධක සහ සංස්කෘතික සංගමය නමින් නම් වෙනසකට බඳුන් වී ඇතත් එදා ආරම්භයේදී පෙන්-





වූ ජවය තව තවත් මුවහත් කරගනිමින් ඉදිරියටම යමින් තිබෙන බව අපට පෙනෙයි. ක්රේගිබර්න් සූරිය උදානය දවසින් දවස වඩ වඩාත් සාර්ථකත්වයට පත්වෙමින් තිබෙන්නේ ඒ ජවය නිසා ය. ඒ ගමන හසුරුවමින් සිටින නව සභාපති චන්දන ඉඹුලාන ලේකම් අසංග විතාරණගේ සහ උපුල් චන්දන වැනි මහත්වරුන් අපේ අගැයීමට ලක් විය යුතුය.

තවත් බොහෝ කාලයක් සූරිය උදානය ඉදිරියටම යන බව අපට විශ්වාස ය.



ජගත් ජේ එදිරිසිංහ

